**හපුතලේ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභාවට ලැබුණු කැබ් රථයේ වටිනාකම වූ රු.2,795,000 ක් ස්ථාවර වත්කම්වල ඇතුළත් කර නොතිබුණි.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය වෙනුවෙන් ගෙවිය යුතු පොලිය මූල්‍ය ප්‍රකාශනවල රු.579,273 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි දණ්ඩන ගාස්තු ආදායම රු.389,487 ක් අඩුවෙන් ද මුද්දර ගාස්තු ආදායම රු.3,297,282 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 10,441,121 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.7,260,384 ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,341,259 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,538 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු තක්සේරුවක් අවසන් වරට සිදුකර තිබුණේ 2002 වර්ෂයේ දී බැවින්, වර්ෂ 5 කට වරක් දේපල වල වාර්ෂික වටිනාකම් තක්සේරු නොකිරීමෙන් වරිපනම් බදු ආදායම පහල මට්ටමක පැවතිණි.

### 2.2.2 බලපත්‍ර ගාස්තු

(අ) සභා බල ප්‍රදේශය තුළ වූ දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනූ එඩිසම් බංගලාවට හා ලිප්ටන් ෂීට් නැරඹුම් ස්ථානයට අයත් වෙළඳ ව්‍යාපාර 03 ක් වෙනුවෙන් 2015 වර්ෂයේ දී වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1893 දරන ගැසට් නිවේදනය අනුව ප්‍රදේශයේ ස්ථාපිත සම්ප්‍රේෂණ කුළුණු 09 ක් සඳහා බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව මාසික බදු කුලී ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මගින් තක්සේරු නොකර සභාව සතු කඩ කාමර 43 ක 2012 සැප්තැම්බර් මස 28 සහ 2013 ජනවාරි 31 වන දින පැවති සභා තීරණ මත කුලී අයකරමින් පැවතුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.704,869 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,855,400 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2015 මැයි 15 දින සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු සභාවේ මන්ත්‍රීවරුන් 09 දෙනෙකු සඳහා 2015 මැයි මාසයට අදාලව රු.90,000 ක් සභික දීමනා වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන 2014 යටතේ ඉදිකිරීම් කටයුතු සඳහා සභාව වෙත ලැබී තිබූ මුදලින් රු.85,356 ක් සමාලෝචිත වර්ෂයේ දී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

(ඇ) රජයේ ආයතන සංග්‍රහය xxiv වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති ප්‍රකාරව සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැරගිය සේවකයින් 11 දෙනෙකුගෙන් 2007 සිට 2011 වර්ෂය දක්වා කාලයට අයත් හිඟ හිටි එකතුව රු.54,562 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

(අ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම් කොටස් 03 ක ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිලි ඉදිකර බාහිර පාර්ශවයන්ට කුලියට ලබාදී තිබූ අතර උක්ත ඉදිකිරීම් අනවසර ඉදිකිරීම් ලෙස සලකා ප්‍රාදේශීය ලේකම් නීතිමය පියවර ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් රොහැම්ටන් - දියතලාව - බණ්ඩාරවෙල ජාතික මහා මාර්ගයට අයත් භූමියෙහි රු.2,000,000 ක් වැයකර සභාව කඩ කාමර 19 ක් ඉදිකර මාසික කුලී ගෙවීමේ පදනම මත හා වසර 03 ක කාලයක් සඳහා රු.6,945,751 ක ආපසු නොගෙවන පෙර විකුණුම් වටිනාකමක් අයකර බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබාදී තිබූ අතර උක්ත ඉදිකිරීම් අනවසර ඉදිකිරීම් ලෙස සලකා මාර්ග සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

2015 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

4.5 **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

සභාව සතු වටිනාකම රු.6,180,000 ක් වූ 2010 වර්ෂයේ මිලදී ගෙන තිබූ මයික්‍රෝ කැබ් රථය සහ 1998 සහ 2000 වර්ෂවල මිලදී ගෙන තිබූ වටිනාකම ඉදිරිපත් නොවූ කැබ් රථ දෙකක් නිෂ්කාර්යව සභා භූමියේ ගාල්කර තිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය තොග පාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය